**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - 2021**

---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේත නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍ර කාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 81 A ඡේදයට අනුව වර්ෂයේ බදුපසු ලාභය හෝ අලාභය වෙන්ව දැක්වෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12හි 61 A ඡේදයට අනුව වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගන්නා අයිතමයන්ට අදාළ විලම්භිත බදු අගය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආයුගණක ලාභය රු.54,947,608 මත විලම්භිත බදු අගය වන රු.13,187,426 වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විලම්භිත බදු ගණනය කිරීමේදී බදු අනුප්‍රමාණය ලෙස සියයට 28 යොදා නොගැනීම සහ හඳුනා නොගත් විලම්භිත බදු අගය වූ රු.72,000 නිවැරදි කර ගැලපූ විට 2021 වර්ෂය සඳහා ශුද්ධ විලම්භිත බදු අගය රු.187,736,667 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ එය රු.219,110,112 ක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් අවසන් ශුද්ධ විලම්භිත බදු වගකීම රු.31,373,445 කින් අධිතක්සේරු වී තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි බදු අනුප්‍රමාණ යොදා ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මෘදුකාංග ක්‍රමක්ෂය වටිනාකම රු.3,496,361 ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුල රු.4,382,527 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.886,166 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදිය. 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෘදුකාංග ක්‍රමක්ෂය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්තා සහ සංස්ථාවේ බදු ගෙවීම් සම්බන්ධ බදු ගිණුම් අනුව 2021 දෙසැම්බර් 31 දිනට මුළු බදු වගකීම රු.230,199,525 ක් (දඩ මුදල් රහිතව) විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු.137,473,990 ක් ලෙස දැක්වීමෙන් ගෙවිය යුතු හිඟ බදු වටිනාකම රු.92,725,535 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) විකාශනාගාරයක් පවත්වාගෙන යාමට බදු පදනම මත ලබාගෙන තිබුණු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 0.3194 කට අදාලව නීතිපති විසින් අනුමතකර තිබෙන ක්‍රමවේදයට අනුව 1995 සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු බදු කුලිය රු. 10,969,208 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ) ලැබිය යුතු තැන්පතු | 9,707,462 | 9,287,782 | 419,680 | විගණන නිරීක්ෂණය නිවැරදිය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ)ගුවන් කාල ණයගැතියෝ | 291,123,491 | 289,389,368 | 1,734,123 | විගණන නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිවඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ඇ) ගුවන්කාල ණයහිමියෝ | 13,179,619 | 15,568,759 | 2,389,140 | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ඉඩම | 7,574,763 | හිමිකම ඔප්පු, වටිනාකම සනාථ | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු |

| | | | | |
|---|---|---|---|---|
| | | කෙරෙන ලියවිලි, ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා | | කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ගොඩනැගිලි | 431,223,877 | ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි සහ භෞතික සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) ලංකා පුවත් ආයතනයේ කොටස් සඳහා ආයෝජනය | 1,000,000 | කොටස් සහතික | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |
| (ඈ)ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම | 449,874 | ශේෂ තහවුරු කිරීම් | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |
| (ඉ) ලංකා බැංකු - මැඩ්‍රාස් බැංකු ගිණුම | 1,842,540 | ශේෂ තහවුරු කිරීම් | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (උ) වියදම් | 110,104,761 | අනුමත ගෙවීම් වවුචර | මෙම වවුචර්පත් සොයා බලා ඉදිරිපත් කරමි. | වියදම් තහවුරු කිරීම සඳහා අනුමත ගෙවීම් වවුචර ඉදිරිපත් කළයුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගුවන්කාල ණයගැති ශේෂය රු.291,123,491 ක් විය. ඉන් රු.99,766,903 ක් රාජ්‍ය ආයතන වලින් ද රු.191,356,588 ක් පෞද්ගලික ආයතන වලින්ද නියෝජනය වී තිබුණු අතර රාජ්‍ය ආයතන 2 ක පමණක් රු.30,961,343 ක් ණයගැති ශේෂ පවතින බව එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව සනාථ විය. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වර්ෂ 2 ත් 10 ත් අතර කාලයට අදාළ රු.12,006,507 ක ලැබිය යුතු අනෙකුත් ආදායම් ශේෂ 7 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි | විගණන නිරීක්ෂණය නිවැරදිය. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.16,755,303 ක් වූ විවිධ ණයගැති ශේෂ තුළ වර්ෂ 2ත් 20ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.6,784,292 ක් වූ ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු.149,420,035 ක් වර්ෂ 40 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණු අතර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.145,162,769 ක් විය. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | දිගු කලක් පවතින උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ.371(2) (ආ) සහ 371(5) අනුව මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට | සේවා අවශ්‍යතාව මත මෙම අත්තිකාරම් නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවද අවස්ථා 21 කදී සීමාව ඉක්මවා රු.5,850,889 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 04 වන වගන්තිය අනුව යම් නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් නොදිය යුතු වුවද ඊට පටහැනිව සංස්ථාව විසින් සමලෝචිත වර්ෂයේදී නිලධාරීන් 18 දෙනෙකුට අවස්ථා 68 කදී රු.1,674,595 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | රාජකාරියේ ස්වභාවය අනුව විශේෂිත අනුමැතියක් යටතේ මෙලෙස අත්තිකාරම් නිකුත් කර ඇතත් එම අත්තිකාරම් නිසි පරිදි පියවා ගැනීමට කටයුතු කර ඇත. | සංස්ථාවේ ලිඛිත උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 396(ඇ)(i) හා (iii) | 2021 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ඉක්ම වූ රු.2,624,539 ක් වටිනා චෙක්පත් 37 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් මුදල් රෙගුලාසි 396 යටතේ අවලංගු කිරීමට මේවන විට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක | නිල වාහනයක් හිමි නිලධාරියෙකුට එම නිල වාහනය හෝ රු.50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ | විගණන විමසුම් සමග එකඟ වේ. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | |
|---|---|
| PED 01/2015 | අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ලබා ගත හැකි වුවද හිටපු සභාපතිවරයා සඳහා මෝටර් රථයක් වෙන්කර තිබියදී, සමාලෝචිත වර්ෂයේ මාස තුනක් සඳහා මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලෙස රු.173,453 ක් ගෙවා තිබුණි. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ ප්‍රධාන ජංගම ගිණුමට 2020 අගෝස්තු සිට 2021 නොවැම්බර් දක්වා සිදුකර තිබුණු රු.3,304,086 සෘජු බැර (Credit Transfer ) කිරීම් සහ කැසට් විකුණුම්වලට අදාළ රු.5,623,574 ක සෘජු බැර කිරීම් සහ රු.2,946,840 සෘජු හර (Debit Transfers) කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාවේ ප්‍රධාන ගිණුමේ හා කැසට් විකුණුම් සඳහා භාවිත කරන ගිණුමේ සෘජු බැර කිරීම් 2022 අගෝස්තු මස අවසන් වන විට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සෘජු බැර කිරීම් හඳුනා ගෙන ලෙජර වලට ඇතුළත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදු පෙර) රු.9,286,276 ක ලාභයක් වූ අතර ඊට අනුරූප වර්ෂයේ අලාභය රු.2,306,987 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,592,363 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංස්ථාවේ ගුවන්කාල විකුණුම් ආදායම රු. 85,675,755 කින් වැඩිවීම හා පරිපාලන වියදම් රු. 45,875,198 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.85,675,755 කින් වැඩිවී තිබූ අතර පරිපාලන, බෙදාහැරීම සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.45,774,799 කින් අඩුවී තිබුණි. ඒ අනුව සමාලොචිත වර්ෂයේදී බදු පසු ලාභය රු. 23,023,942 කින් වර්ධනය වී තිබූ අතර ලබා දුන් රජයේ ප්‍රධාන සියයට 21.6 කින් එනම් රු. 95,000,000 කින් අඩු වී තිබූ නමුත් තවදුරටත් මෙහෙයුම් අලාභය ලෙස රු.331,610,120 ක් වාර්තා කර තිබීමෙන් (රාජ්‍ය ප්‍රදාන රහිතව) භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතින බව නිරීක්ෂණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම අනුපාතයේ සහ ක්ෂණික අනුපාතයේ සුළු වර්ධනයක් පෙන්නුම් කෙරෙන නමුත් ජංගම වත්කම්හි ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 02 සිට 47 දක්වා පැරණි දේශීය ණයගැති ශේෂය රු.53,733,604 ක් හා විදේශීය ණයගැති ශේෂ රු.66,520,620 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් ලාභ අනුපාතය - 80.5 සිට - 52.57 දක්වා වැඩිවී තිබූ අතර විකුණුම් ආදායම ඉහළ යාමත්, පරිපාලන වියදම් හා වෙනත් මෙහෙයුම් වියදම් පහළ යාම මීට හේතුවී තිබුණි. කෙසේ වුවද මෙලෙස මෙහෙයුම් අලාභ ලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් හා අනෙකුත් වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් රු.345,000,000 ක ප්‍රතිපාදන ලබාගැනීමටද සිදුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් 2021 ජුනි සිට පැවති මාසික වැටුප වූ රු. 93,020 ක් වෙනුවට විධිමත් අනුමැතියකින් තොරව රු. 120,020 ක මාසික වැටුපක් ලබාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා හිඟ වැටුප් ලෙස රු.603,900 ක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙහි කොටස් මිලදී ගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1993 වර්ෂයේදී රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් 1993 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. | විගණන විමසුම සමග එකඟ වේ. | ආයෝජන සම්බන්ධයෙන් සොයා බලා ප්‍රතිලාභ ලබාගැනීමට ක්‍රියාකළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකර සංස්ථාවේ 6 හා 10 වන මැදිරිවල තිබුණු පියානෝ 03 ක් අලුත්වැඩියා කර තිබූ අතර 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ද මෙම කාර්යය ඇතුළත් කර නොතිබුණි. මැදිරි අංක 06 හි පැවති පියානෝව අලුත්වැඩියාව සඳහා රු.460,000 ක් ගෙවා තිබුණු අතර මැදිරි අංක 10 හි පියානෝ 02 අලුත්වැඩියා කිරීම සඳහා බැහැරට රැගෙන ගොස් 2021 මැයි 21 දින සංස්ථා පරිශ්‍රයට ගෙනවිත් තිබුණි ද 2022 අගෝස්තු 16 වන දින විටත් ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොතිබුණි. පෞරාණික වටිනාකම සහ විශ්වාසනීයත්වය රැකගැනීම සඳහා පියානෝ අලුත්වැඩියා කිරීමේදී එම කටයුතු සංස්ථා භූමිය තුළදීම සිදුකිරීම මීන් පෙර අනුගමනය කරන ලද ක්‍රමවේදය වුවද මෙම පියානෝ 03 සභාපතිගේ සෘජු මැදිහත්වීම මත ආයතනයෙන් පිටතට රැගෙන ගොස් අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. එසේම පියානෝ ඉන්වෙන්ට්‍රිගත කිරීමේදී හඳුනාගැනීමට විශේෂ අංක හා සලකුණු යොදා නොතිබීම හේතුවෙන් සංස්ථාවෙන් පිටතට රැගෙන ගිය පියානෝ 3 නිවැරදිව ආපසු ලැබුනේද යන්න තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් සංස්ථාව සතුව නොතිබුණි. | විගණන විමසුම සමග එකඟ වේ. මෙම කාර්යය ඉංජිනේරු අංශයේ අනුදැනුම මත සිදුවී නොමැති බව නිරීක්ෂණය වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළයුතු අතර රාජ්‍ය දේපලවල ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළයුතුය. |

## 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථා සේවයෙන් මුදාහැර තිබුණ ද දැනට සංස්ථා සේවයේ සිටින නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.520,995 ක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2009 ත් 2015 ත් අතර කාලය තුලදී සංස්ථා සේවයෙන් වෙනත් ආයතන වෙත මුදා හළ නිලධාරීන්ගෙන් ලැබිය යුතු රු. 2,757,890 ක් අයකර ගැනීමට 2022 අගෝස්තු වන විටත් කටයුතු කර නොතිබුණි. වෙනත් ආයතන වෙත මුදාහැර නැවත සංස්ථා සේවයට වාර්තා කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,899,146 ක් හා 2021 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරිනියගෙන් අයවිය යුතු රු.118,983 ක් මෙම මුදලට ඇතුළත් වී තිබුණි. | මෙම අයකිරීම් සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත මුදල් ඉල්ලා ලිපි යොමුකර ඇත. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව තනතුරු 41ක පුරප්පාඩු 271 ක් සහ තනතුරු 34 කට අදාල තෘතීය මට්ටමේ, ද්විතිය මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ පිළිවෙලින් නිලධාරීන් 60 ක්, 57 ක් සහ 67 ක් ලෙස අතිරික්ත සේවකයින් සංඛ්‍යාවක් පැවතුණි. | සංස්ථාවේ පැරණි ශ්‍රේණිගත කිරීම් පැරණි සේවකයන් සඳහා මේ වන විටත් ක්‍රියාත්මක වේ. මේ නිසා 2019.06.07 දිනැති අනුමත සේවක සංයුතියේ ප්‍රතිපාදන මත නව බඳවාගැනීම් ක්‍රියාත්මක කිරීමට පෙර සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 ක්‍රියාත්මක කිරීමට පෙර ඉහත පැරණි බඳවාගැනීම් අනුව පැරණි ශ්‍රේණිගත කිරීම් සිදුකර තිබූ බැවින් අනුමත සේවක සංයුතියේ ද්විතීක, තෘතීක හා ප්‍රාථමික මට්ටම්වල සේවක සංයුතියේ විචලනයන් සිදුවේ.<br>නමුත් කළමනාකරණ සේවා | අනුමත කාර්ය මණ්ඩලයට අනුව තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | චක්‍රලේඛ 2/2016 ක්‍රියාත්මක කිරීමෙන් පසු පැරණි ශ්‍රේණිගත කිරීම් නතර කර ඇති බැවින් එය ක්‍රියාත්මක 2016.04.25 බඳවාගත් සේවකයන් සඳහා පැරණි ශ්‍රේණිගත කිරීම් නතර කර ඇති බැවින් ඉන් ඔබ්බට ශ්‍රේණිගත කිරීම් මත ඉහත පරිදි සිදුවීමට ඇති සේවක විචලනයන් සිදු නොවනු ඇත. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් නිකුත් කළ යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ අත්පොතෙහි 6.5.3 ඡේදය අනුව සෑම මූල්‍ය වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා සභාගත කළයුතු වුවද, 2019 සහ 2020 වර්ෂ වල වාර්ෂික වාර්තා 2022 ජුනි 29 දින වන විට සභාගත කර නොතිබුණු අතර 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2022 අගෝස්තු මාසය වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | විගණන විමසුම සමග එකඟ වේ. 2019 වාර්ෂික වාර්තාව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. නමුත් 2020 වාර්ෂික වාර්තාව තවමත් මුද්‍රණයේ පවතී. | වාර්ෂික වාර්තා අප්‍රමාදව සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉංජිනේරු අංශයේ ව්‍යාපෘති 19 ක, පාලන අංශයේ ව්‍යාපෘති 2 ක, වෙළෙඳ සේවයේ ක්‍රියාකාරකම් 2 ක, ඉංග්‍රීසි සේවයේ ක්‍රියාකාරකම් 1 ක, සිංහල ස්වදේශීය සේවයේ ක්‍රියාකාරකම් 1 ක, රජරට සේවයේ ක්‍රියාකාරකම් 1 ක සහ කඳුරට සේවයේ ක්‍රියාකාරකම් 3 ක ප්‍රගතිය ප්‍රගති සමාලෝචන වාර්තාවට ඇතුළත් නොකිරීම නිසා ඒවායේ ප්‍රගතිය පරීක්ෂාකළ නොහැකි විය. | විගණන විමසුම සමග එකඟ වේ. | ක්‍රියාකාරී සැලැස්මේ ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ඒවායේ ප්‍රගතිය දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රවණ පර්යේෂණ අංශය විසින් සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබූ ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ සංගීත අංශය, සංවර්ධන ඒකකය, මධ්‍යම ක්‍රියාකාරී අංශය, රුහුණු සේවය, වයඹ සේවය සහ ක්‍රීඩා අංශයන්හි ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කර තිබුණි. | විගණන විමසුම සමග එකඟ වේ. රටේ පැවති තත්ත්වය හමුවේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කිරීමත් සැලැස්මට අනුව කටයුතු කිරීමත් කළ යුතුය. |